# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2009 අංක 40 දරන ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2009 ජූලි මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2009 අංක 40 දරන ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී) 32/2007.

## ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියලු කටයුතු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කොට සහ ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද, එම සංගමය සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 40 දරන ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංගමය විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාව තුළ ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාවේ සහ එම වෘත්තියේ නියම කරන ලද අංශ එනම්, ගොඩනැගිලි, පාලම්, කුළුනු, අත්තිවාරම් සහ ක්‍රීඩා මණ්ඩප ඉදිකිරීම් ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම;

(ආ) ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව සම්බන්ධ දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා පැවැත්වීම සහ ප්‍රදර්ශන පැවැත්වීම;

(ඇ) පුස්තකාල පවත්වාගෙන යාම සහ ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව හා සම්බන්ධ පුවත්පත් හා ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීම ;

(ඈ) ව්‍යුහාත්මක ඉංජිනේරු දැනුම වැඩිදියුණු කර ගැනීම සඳහා අදාළ පර්යේෂණවලට උනන්දු කරවීම;

(ඉ) ව්‍යුහාත්මක ඉංජිනේරුවන්ගේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම්කරුවන්ගේ සුදුසුකම් සඳහා යෝග්‍ය ප්‍රමිති සැකසීම, විභාග හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම;

(ඊ) සංගමයේ සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතු ක්‍රමවත් කිරීම සහ ව්‍යුහාත්මක ඉංජිනේරු වෘත්තීය චර්යාවේ ඉහළ ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ඔවුනට සහාය වීම ;

(උ) ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව සම්බන්ධ ආරවුල් බේරුම් කිරීම මගින් නිරවුල් කිරීමට උනන්දු කරවීම හා සහාය වීම සහ බේරුම්කරුවන් නම් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන මුදල් සංස්ථාව විසින් සුදුසු යයි අදහස් කරනු ලබන ආකාරයකට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත මුදල් අත්තිකාරම් වශයෙන් දීම හෝ ණයට ගැනීම හෝ එක්රැස් කිරීම;

(ආ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ආයතන සහ පුද්ගලයන් සමග අවශ්‍ය වන සියලු ගිවිසුම් කොන්ත්‍රාත්වලට ඇතුළු වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඈ) සංස්ථාවේ යම් අරමුණක් හෝ අරමුණු සියල්ලම මුදුන්පත් කරවා ගැනීමට ඍජුවම හෝ වක්‍රාකාරයෙන් හෝ බලපාන යම් භාරයක් සම්බන්ධ කොන්දේසි භාර ගැනීම, පිළි ගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(ඉ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන සියලු මුදල් ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම්පත් වශයෙන් හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාවේ නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයේ යෙදවීම , සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසාන කිරීම සහ සංස්ථාවේ විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි ඔවුන්ගේ වැටුප්, දීමනා, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ගෙවීම ;

(උ) සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු දරන ශ්‍රී ලංකාව තුළ හෝ පිටත පිහිටි සංවිධාන, සංගම් හෝ වෙනත් ආයතන සමග සම්බන්ධ වීම;

(ඌ) අනු කමිටු පත් කිරීම.

5. මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ 6 වැනි වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව "විධායක කමිටුවක්" වෙත සංස්ථාවේ කළමනාකරණය, පාලනය සහ පරිපාලනය පවරනු ලැබිය

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

යුතු ය. මේ පනත යටතේ සාදන ලද රීතිවලට අනුකූලව නිලධරයන් තෝරා ගන්නා තෙක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී සමිතියේ නිල දරන සාමාජිකයින් පළමු විධායක කමිටුවේ නිල දරන්නන් විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින්, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන්ගේ යෝග්‍යතාවය, සුදුසුකම් සහ ඔවුන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, සාමාජිකත්වය අවසාන වීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ විධායක කමිටුවට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, නිල දරන්නන් සේවයෙන් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම සහ විධායක කමිටුවේ බලතල, කාර්යය සහ ක්‍රියා පටිපාටිය;

(ඇ) සංස්ථාවේ විවිධ සේවකයන්ගේ පත් කිරීම, සේවයෙන් පහ කිරීම, බලතල, කාර්යය, කර්තව්‍ය සහ ක්‍රියා පටිපාටිය;

(ඈ) සංස්ථාවේ විධායක කමිටුවේ, සංස්ථාවේ හෝ එහි යම් විනය කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, පුරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ නිවේදනය කිරීම, න්‍යාය පත්‍ර සහ ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම;

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම සඳහා ; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද ආකාරයටම එවැනි ම රැස්වීමක දී කළ යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් එහි රීතිවලට යටත් විය යුතු ය.

නාමය භාවිතා කිරීම.

**7.** (1) සංගමයේ සෑම සාමාජිකයකුම පනත යටතේ සාදන ලද රීතිවලට අනුව සුදුසුකම් ලබා ඇත්නම් එම සාමාජිකයාගේ නම අගට "එම්. එස්. එස්. ඊ. (එස්. එල්.)" යන කෙටි පදවි නාමය භාවිතා කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) සෑම සාමාජිකයකුම අධි සාමාජිකයකු ලෙස බඳවා ගත් විට එම අධි සාමාජිකයාගේ නම අගට "එෆ්. එස්. එස්. ඊ. (එස්. එල්.)" යන කෙටි පදවි නාමය භාවිතා කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) සංගමයේ සෑම සාමාජිකයකුම ගරු සාමාජිකයකු ලෙස බඳවා ගත් විට එම සාමාජිකයාගේ නම අගට "ගෞරව එෆ්. එස්. එස්. ඊ. (එස්. එල්.)" යන කෙටි පදවි නාමය භාවිතා කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරීම්, සම්මාදම් හෝ දායක මුදල් වශයෙන් ලැබෙන සියලු මුදල් සංස්ථාවේ විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ත්‍යාගයක්, ප්‍රදානයක් හෝ තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර නැතහොත් අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, එවැනි

සියලු දේපළ සංස්ථාවේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් කටයුතු කිරීමේ පූර්ණ බලය මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට තිබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමතයකට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තු ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි පැවති සංගමයේ සියලු ණය සහ බැරකම් සංස්ථාවේ ණය සහ බැරකම් වශයෙන් සලකනු ලැබිය යුතු වන අතර මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමට අයවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී ද එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමතයකට පත් කිරීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ විධායක කමිටුව විසින් තීරණය කළ යුතු ය.

යම් තැනැත්තකු විසින් දරන ලද වියදමක් ආයතනය විසින් ගෙවිය යුතු බව.

**13.** යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ සංගමයේ විධානය මත ඔහු විසින් සිදු කරන ලද හෝ සිදු කිරීමට අරමුණු කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිටදී ඔහුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තකදී දරන ලද යම් වියදමකදී ඒ ක්‍රියාව සිදු කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය පිළිගන්නේ නම් ඒ වියදම ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**14.** (1) විධායක කමිටුව විසින් සංස්ථාවේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වසරකටම වරක්වත් පරීක්ෂා කොට විගණනය කළ යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ,

අදහස් වේ.

**15.** සංස්ථාවේ මුද්‍රාව, එහි විධායක කමිටුව විසින් නිසි පරිදි බලය පවරන ලද එවැනි වෙනත් තැනැත්තන් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**16.** සංස්ථාවේ සාමාජිකයන්ගේ විනය පවත්වාගෙන යාම සඳහා විනය කමිටු පත් කිරීමට සහ වෘත්තීමය ප්‍රමිතීන් පාලනය කිරීම සඳහා කලින් කල අවශ්‍ය බව පෙනී යන වෙනත් පියවර ගැනීමට සංස්ථාවට බලය ඇත. විනය කමිටු.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** මේ පනතේ සඳහන් කිසිවක් මගින් ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.